# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT –E2025

**ලෝක සිනමාව පිළිබඳ ගවේෂණය**

**<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

01. ලෝක සිනමාව ගවේෂණය කිරීමට උපකාරී වන චිත්‍රපට වර්ගීකරණයක් ඉදිරිපත් කොට එම චිත්‍රපට වර්ග කෙටියෙන් හඳුන්වා දෙන්න.

02. හොලිවුඩ් සිනමාවේ වෘත්තාන්ත චිත්‍රපට ෂානර (Genre) පිළිබඳ විග්‍රහයක් කරන්න.

03. වාර්තා සිනමාවේ බිහිවීම විස්තර කොට එය සුවිශේෂී ගණයේ චිත්‍රපට වර්ගයක් ලෙස සැලකෙන්නේ කුමන කරුණු නිසා දැයි පැහැදිලි කරන්න.

04. නිහඬ යුගයේ ඇමරිකානු හාස්‍යජනක (Comedy) සිනමාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ විස්තරයක් කරන්න.

05. සර්ජි අයිසන්ස්ටයින්ගෙන් **<u>හෝ</u>** ඩී. ඩබ්. ග්‍රිපිත්ගෙන් **<u>හෝ</u>** සිනමා කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක්කරන්න.

06. ජර්මන් ප්‍රකාශනවාදී සිනමාව බිහිවීමට හේතු පාදක වූ පසුබිම විස්තර කර, එම සිනමා ප්‍රවණතාවෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

07. ඉතාලියානු නවතාත්වික‌වාදී (Neo – Realism) සිනමාව පිළිබඳ විවරණයක් කරන්න.

08. ඔබ කැමති සුප්‍රකට විදෙස් සිනමාකරුවෙකු හඳුන්වාදෙමින් ඔහුගේ සිනමා භාවිතය විචාරයට ලක්කරන්න.

09. ඉන්දියානු බොලිවුඩ් සිනමාවේ ජනප්‍රිය දහරාවේ චිත්‍රපටවල සුලබ ව දැකිය හැකි කතා වස්තු හා ආකෘතික ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් **<u>එකක්</u>** තෝරාගෙන රචනාවක් ලියන්න.

    අ) ප්‍රංශ නවරැල්ල
    ආ) කලාත්මක චිත්‍රපට

****************************